9 ශ්‍රේණිය ගණිතය

09 ඒකකය - 2022

ද්‍රව මිනුම්

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

09 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 2ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

09. ද්‍රව මිනුම්

පරිමාව හා ධාරිතාව

- යම් ඝන වස්තුවක් හෝ ද්‍රවයක් හෝ අවකාශයේ අත් කර ගන්නා ඉඩ ප්‍රමාණය එම ඝන වස්තුවේ හෝ ද්‍රවයේ **පරිමාව** ලෙස හැඳින්වේ.
- යම් භාජනයකට අල්ලන උපරිම ද්‍රව පරිමාව එම භාජනයේ **ධාරිතාව** ලෙස හැඳින්වේ.

පුනරීක්ෂණ අභ්‍යාසය

1. 1 *l* =1000 ml වේ. එය භාවිත කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

ml	*l* හා ml		*l* (දශම සංඛ්‍යාවක් ලෙස)
	l	ml	
2500	2	500	2.5
....	3	000	
3500	3		
....	4	500	4.5
....	0	500	
200			
50			
....			3.25
....	0	25	
....			0.005

පුනරීක්ෂණ අභ්‍යාසය

1.

I.	2500 ml	2 l 500 ml	2.5 l
II.	3000 ml	3 l 000 ml	3.0 l
III.	3500 ml	3 l 500 ml	3.5 l
IV.	4500 ml	4 l 500 ml	4.5 l
V.	500 ml	0 l 500 ml	0.5 l
VI.	200 ml	0 l 200 ml	0.2 l
VII.	50 ml	0 l 50 ml	0.05 l

VIII.	3250 ml	3 l 250 ml	3.25 l
IX.	25 ml	0 l 25 ml	0.025 l
X.	5 ml	0 l 5 ml	0.005 l

2. පහත රූපවල දැක්වෙන ඝනකයේ හා ඝනකාභයේ පරිමාව ගණනය කර ඇති ආකාරය අනුව ඊට පහළින් දැක්වෙන වගු දෙක සම්පූර්ණ කරන්න.





පරිමාව = 5 cm × 5 cm × 5 cm = 125 cm^3

පරිමාව = 10 cm × 5 cm × 4 cm = 200 cm^3

i. ඝනකය

පැත්තක දිග (cm)	පරිමාව (cm^3)
2	.... × .... × .... = ...
4	
6	
7	
8	
10	
12	

ii. ඝනකාභය

දිග (cm)	පළල (cm)	උස (cm)	පරිමාව (cm^3)
3	2	2	... × ... × ... = ...
5	3	4	
8	6	5	
10	5	10	
10	5	6	
12	10	8	
12	6	5	
15	8	10	
20	7	8	

2. ඝනකය

I.	2cm	x	2cm	x	2cm	=	8cm^3
II.	4cm	x	4cm	x	4cm	=	64cm^3
III.	6cm	x	6cm	x	6cm	=	216cm^3
IV.	7cm	x	7cm	x	7cm	=	343cm^3
V.	8cm	x	8cm	x	8cm	=	512cm^3
VI.	10cm	x	10cm	x	10cm	=	1000cm^3
VII.	12cm	x	12cm	x	12cm	=	1728cm^3

ඝනකාභය

I.	3cm	x	2cm	x	2cm	=	$12cm^3$
II.	5cm	x	3cm	x	4cm	=	$60cm^3$
III.	8cm	x	6cm	x	5cm	=	$240cm^3$
IV.	10cm	x	5cm	x	10cm	=	$500cm^3$
V.	10cm	x	5cm	x	6cm	=	$300cm^3$
VI.	12cm	x	10cm	x	8cm	=	$960cm^3$
VII.	12cm	x	6cm	x	5cm	=	$360cm^3$
VIII.	15cm	x	8cm	x	10cm	=	$1200cm^3$
IX.	20cm	x	7cm	x	8cm	=	$1120cm^3$

3. රූපයේ දැක්වෙන භාජනයේ ඇතුළත දිග 30 cm ද පළල 10 cm ද උස 12 cm ද වේ. එහි 7 cm උසකට ජලය පුරවා ඇත.



පහත දැක්වෙන දෑ සොයන්න.

i. භාජනයේ ධාරිතාව

ii. භාජනය සම්පූර්ණයෙන් ම පිරවීමට අවශ්‍ය ජල පරිමාව

iii. භාජනයේ 7 cm උසට පමණක් ජලය පුරවා ඇත් නම් එම ජල පරිමාව

iv. භාජනයේ 7 cm උසට ජලය පිරී තිබිය දී කාන්දුවීමක් නිසා, පැයක් ඇතුළත ජල මට්ටමේ උස 5 cm තෙක් පහත වැටුණ හොත් එම පැය තුළ කාන්දු වූ ජල පරිමාව

3.

I. 30cm x 10cm x 12cm = $3600cm^3$

II. $3600cm^3$ = 3600 ml = 3 l 600 ml

III. 30cm x 10cm x 7cm = $2100cm^3$

($2100cm^3$ = 2100 ml = 2l 100ml)

IV. 30cm x 10cm x 2cm = $600cm^3$

($600cm^3$ = 600 ml)

9. 1 ඝන සෙන්ටිමීරය හා මිලි ලීටරය අතර සම්බන්ධතාව

ඝන සෙන්ටිමීටර 1 = මිලි ලීටර 1

$1\ cm^3 = 1\ ml$

9.1 අභ්‍යාසය

1. *A* කොටුවේ දැක්වෙන පරිමාවට සමාන පරිමාව *B* කොටුවෙන් තෝරා යා කරන්න.

A	*B*
$1000\ cm^3$	25 ml
$10\ cm^3$	25 *l*
$3000\ cm^3$	1 *l*
$1500\ cm^3$	10 ml
$25000\ cm^3$	1.5 *l*
$25\ cm^3$	3 *l*

2. ඝනකාභ හැඩැති භාජන කිහිපයක මිනුම් පහත වගුවේ දැක්වේ. එම වගුව සම්පූර්ණ කරන්න.

දිග (cm)	පළල (cm)	උස (cm)	ධාරිතාව		
			cm^3	ml	*l*
20	10	5			
40	20	10			
35	12	10			
50	35	12			
40	35	25			
25	20	18			

9.1 අභ්‍යාසය

1.

I.	$1000\ cm^3$	25 ml
II.	$10\ cm^3$	25 l
III.	$3000\ cm^3$	1 l
IV.	$1500\ cm^3$	10 ml
V.	$25000\ cm^3$	1.5 l
VI.	$25\ cm^3$	3 l

2.

I. 1000 cm^3 1000 ml 1 l
II. 8000 cm^3 8000 ml 8 l
III. 4200 cm^3 4200 ml 4.2 l
IV. 21000 cm^3 21000 ml 21 l
V. 35000 cm^3 35000 ml 35 l
VI. 9000 cm^3 9000 ml 9 l

3. පතුලේ වර්ගඵලය 240 cm^2 වූ ඝනකාභ හැඩැති භාජනයක 12 cm උසට ජලය පිරී තිබේ. ජලයේ පරිමාව
i. cm^3 වලින් ii. ml වලින් iii. l වලින්
සොයන්න.

3.

I. $240\ cm^2 \times 12\ cm = 2880\ cm^3$
II. 2880 ml
III. 2.88 l

4. සමචතුරස්‍ර හැඩැති පතුලක් සහිත ඝනකාභහැඩැති භාජනයක, පතුලේ වර්ගඵලය 225 cm^2 වේ. එහි ජලය 3.6 lක් පුරවා තිබේ.
i. ජල මට්ටමේ උස සොයන්න
ii. භාජනයේ උස 24 cm නම්, එහි ධාරිතාවෙන් $\frac{2}{3}$ක් ජලයෙන් පිරී ඇති බව පෙන්වන්න.

4.

I. $225\ cm^2 \times h = 3600\ cm^3$
$225h\ cm^2 = 3600\ cm^3$
$$\frac{225h\ cm^2}{225cm^2} = \frac{3600\ cm^3}{225cm^2}$$
$h = 16\ cm$

II. භාජනයේ ධාරිතාව $= 225\ cm^2 \times 24\ cm$
$= 5400\ cm^3$
පිරී ඇති පරිමාව $= 3600\ cm^3$
$$\therefore \frac{3600}{5400} = \frac{2}{3}$$

5. ඇතුළතින් පැත්තක දිග 10 cm වූ ඝනක හැඩැති භාජනයක් සම්පූර්ණයෙන් ද්‍රවයෙන් පුරවා, 15 වාරයක් එම ද්‍රව ප්‍රමාණ දැමීමෙන් 15 l ධාරිතාව ඇති භාජනයක් පිරවිය හැකි බව පෙන්වන්න.

5. ඝනක හැඩැති භාජනයේ ධාරිතාව = 10 cm x 10 cm x 10 cm
= 1000 cm^3 = 1000 ml = 1 l

15 වාරයක් දැමූ විට පරිමාව = 1 l x 15
= 15 l

∴ 15 l ධාරිතාව ඇති භාජනයක් පිරවිය හැකි ය.

9. 2 ලීටරය හා ඝන මීටරය අතර සම්බන්ධතාව

රූපයේ දැක්වෙන
භාජනයේ ධාරිතාව = 1 m x 1 m x 1 m
= 1 m^3



නමුත්, 1 m = 100 cm නිසා
භාජනයේ ධාරිතාව = 100 cm x 100 cm x 100 cm
= 1 000 000 cm^3
= 1 000 000 ml

ඝන මීටරයක් යනු ලීටර 1 000කි.
∴1 m^3 = 1 000 l

9.2 අභ්‍යාසය

1. වගුව සම්පූර්ණ කරන්න.

ඝනකාභ හැඩැති ටැංකියේ ඇතුළත මිනුම්			ටැංකියේ ධාරිතාව	
දිග (m)	පළල (m)	උස (m)	m^3	l
2	2	1	.....	.....
2	1.5	1	.....	.....
1	1	0.5	.....	.....
4	1	.....	8	.....
.....	1.5	3.0	.....	9000
.....	.....	1	1.5	.....

9.2 අභ්‍යාසය

1.

I.	2 m	2 m	1 m	4 m^3	4000 l
II.	2 m	1.5m	1 m	3 m^3	3000 l
III.	1 m	1 m	0.5 m	0.5 m^3	500 l
IV.	4 m	1 m	2 m	8 m^3	8000 l
V.	2 m	1.5 m	3.0 m	9 m^3	9000 l
VI.	1.5m	1m	1m	1.5 m^3	1500l

2. පිහිනුම් තටාකයක දිග 50 m, පළල 25 m හා ගැඹුර 3 m වේ.
- **i.** පිහිනුම් තටාකයේ ධාරිතාව සොයන්න.
- **ii.** තටාකයේ 1.2 m උසට ජලය පුරවා තිබේ නම් එහි අඩංගු ජල පරිමාව ලීටර් කීය ද?
- **iii.** පිහිනුම් තටාකය සම්පූර්ණයෙන් ම ජලයෙන් පිරවීමට තවත් කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය ද?

2.

I. ධාරිතාව = 50 m x 25 m x 3 m
= 3750 m^3
= 3 750 000 l

II. තිබෙන පරිමාව = 50 m x 25 m x 1.2 m
= 1500 m^3
= 1 500 000 l

III. අවශ්‍ය පරිමාව = 3 750 000 l - 1 500 000 l
= 2 250 000 l

3. ධාරිතාව 6.5 m^3 ලෙස සඳහන් කර ඇති තෙල් බවුසරයක් සම්පූර්ණයෙන් ම තෙල්වලින් පුරවා ඇත. මෙම බවුසරයට තෙල් පිරවුම් පොළ 8කට එක් ස්ථානයකට 850 *l* බැගින් තෙල් නිකුත් කිරීමට නියමිතව තිබේ. බවුසරයේ ගබඩා කර ඇති තෙල් ප්‍රමාණය නියමිත පිරවුම් පොළ අටට නිකුත් කිරීමට ප්‍රමාණවත් වේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

3. බවුසරයේ තෙල් පරිමාව = 6500 l

නිකුත් කළ යුතු තෙල් පරිමාව = 850 l x 8

= 6800 l

6500 l < 6800 l

∴ ප්‍රමාණවත් නො වේ.

4. දිනකට එක් පුද්ගලයකුට අවම වශයෙන් ජලය ලීටර 150ක් අවශ්‍ය වේ. ඇතුළත දිග $1\frac{1}{2}$m පළල 1 m හා උස 1 m ප්‍රමාණයේ ඝනකාභ හැඩැති ටැංකියක් ජලයෙන් පිරී තිබේ නම්, එම ජල ප්‍රමාණය පුද්ගලයින් උපරිම කී දෙනෙකුට දිනකට සෑහේ ද?

5. ඝනක හැඩැති ටැංකියක ඇතුළත මිනුම් මීටර 1 බැගින් වේ. මෙම ටැංකිය සම්පූර්ණයෙන් ජලයෙන් පිරී පවතී. ටැංකියෙන් ජලය පිට කරන කරාමයක් විවෘත කළ විට ඉන් ජලය පිට වන්නේ මිනිත්තුවට 50 *l*ක ඒකාකාර වේගයෙන් නම් මෙම කරාමය විවෘත කර කොපමණ කාලයකට පසු ටැංකිය සම්පූර්ණයෙන් හිස් වේ දැයි සොයන්න.

4. 1.5 m x 1 m x 1 m

= 1.5 m^3

= 1500 l

1500 l ÷ 150

= 10

∴ දිනකට උපරිම පුද්ගලයින් 10 දෙනෙකුට සෑහේ

5. 1 m x 1 m x 1 m

= 1m^3

= 1000 l

1000 l ÷ 50

= 20

∴ මිනිත්තු 20 කට පසු ටැංකිය සම්පූර්ණයෙන් හිස් වේ

මිශ්‍ර අභ්‍යාසය

1. විශාල ප්‍රමාණයේ පැණි බීම බෝතලයක ධාරිතාව 1.5 *l* වේ. උත්සව අවස්ථාවක දී මෙම බීම වර්ගයෙන් සංග්‍රහ කිරීමට ඒ සඳහා යොදා ගන්නා කුඩා ප්‍රමාණයේ වීදුරුවකට 150 mlක ප්‍රමාණයක් බීම දැමීමට ද බලාපොරොත්තු වේ. උත්සවය සඳහා 225 දෙනෙකු සහභාගී වේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීම සඳහා අවශ්‍ය වන විශාල ප්‍රමාණයේ බීම බෝතල් අවම ගණන සොයන්න.

මිශ්‍ර අභ්‍යාසය

1. $\frac{150 \text{ ml} \times 225}{1500 \text{ ml}}$

$= 22.5$ $\quad\quad$ ∴ අවම බෝතල් ගණන = 23

2. නිවෙස්වල ජලය ගබඩා කරන ධාරිතා, 500 *l*, 1000 *l*, 2000 *l* වන වතුර ටැංකි මිල දී ගැනීමට වෙළෙඳපොළේ තිබේ. පස් දෙනකුගෙන් යුත් පවුලක ප්‍රධානියෙක් තම නිවෙසට ජලය රැස් කර තබා ගැනීම සඳහා ජල ටැංකියක් මිල දී ගැනීමට අදහස් කරයි. දිනකට එක් පුද්ගලයකුට ජලය 150 *l* ප්‍රමාණයක් උපරිම වශයෙන් අවශ්‍ය වන අතර ගෙදරදොරේ අනෙකුත් කටයුතුවලට 200 *l*ක් අමතරව අවශ්‍ය වන බව ද තීරණය කරන ගෙහිමියා දිනකට එක් වරක් පමණක් ටැංකිය ජලයෙන් පිරවීමට බලාපොරොත්තු වේ. මෙම තීරණ අනුව එම නිවෙස සඳහා සුදුසු වන්නේ කවර ප්‍රමාණයේ ටැංකියක් දැයි නිර්ණය කරන්න.

2. $(150 \text{ l} \times 5) + 200 \text{ l}$

$= 750 \text{ l} + 200 \text{ l}$

$= 950 \text{ l}$ $\quad\quad$ ∴ සුදුසු ටැංකියේ ප්‍රමාණය = 1000 l

NALANDA V නාලන්දා විද්‍යාලය - කොළඹ 10 DA VIDYALAYA

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණය** NALANDA VIDYALAYA

9 ශ්‍රේණිය | **ගණිතය** | **ඒකකය : 9- ද්‍රව මිනුම්**

1) මේවා *ml* වලින් ලියන්න

i) 2500 cm^3 ii) 570 cm^3 iii) 12000 cm^3 iv) 83 cm^3

2) මෙම පරිමා *l* වලින් දක්වන්න.

i) 8cm^3 ii) 13 m^3 iii) 4.2 m^3 iv) 1 852 cm^3 v) 16 m^3

2) මෙම භාජනවල ධාරිතාව ලීටර වලින් සොයන්න.

i)



ii)



iii)



3) දිග පළල හා උස පිළිවෙලින් 4m, 3m හා 2m වන ඝනකාභ හැඩැති ටැංකියක් සම්පූර්ණයෙන් ජලයෙන් පිරී ඇත. එහි ජලය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට සවිකර ඇති නලයෙන් මිනිත්තුවකට 300l ක ජල පරිමාවක් ඉවත් කෙරේ. ටැංකිය හිස් කිරීමට ගතවන කාලය සොයන්න.

4) පතුලේ මිනුම් 40 cm x 22m වන ඝනකාභ හැඩැති ටැංකියක 30 cm ක් උසට ජලය පිරී ඇත. එහි අඩංගු ජල පරිමාව ලීටර් කොපමණ ද?

5) පතුලේ මිනුම් 35 cm x 20 cm වන ඝනකාභ හැඩැති භාජනයකට 21 l ක ජලය ප්‍රමාණයක් දැමූ විට එහි ජල මට්ටමේ උස ගණනය කරන්න.

පාඩමේ නම - ද්‍රව මිනුම්

සැකසුම - ඩී.එම් .ගුණවර්ධන / පාසල - අම්/ දේවාලහිඳ විද්‍යාලය/ 0713840888

(1ධාරිතාව යනුවෙන් හඳුවන්නේ කුමක්ද?

(2) ධාරිතාව හා පරිමාව අතර වෙනස පැහැදිලි කරන්න.

(3) ද්‍රවයක් මැනීමේදී භාවිතාවන ඒකක මොනවාද?



පරිමාව = දිග × පළල × උස

= 20 × 10 × 5

=1000cm²

ඝන වස්තුවක පරිමාව cm^3 වලින් දැක්වුවද,එම මිනුම් සහිත භාජනයක ධාරිතාව ml හෝ l වලින් දැක්විය යුතුය.

බැවින් | $1cm^3$ = 1ml | එහි ධාරිතාව 1000 ml වේ.

| 1000ml = | බැවින්ධාරිතාව 1l වේ.

උදා-:

අභ්‍යන්තර මිනුම් 50cm, 40 cm හා 25 cm වන ඝනකාභ හැඩැති භාජනයක ධාරිතාව ලීටර් වලින් සොයන්න.

භාජනයේ පරිමාව = 50× 40 × 25

= 50000 cm^3

ද්‍රව ප්‍රමාණය = 50000ml

ධාරිතාවය = 50000 ÷ 1000 = 50l

(4) දිග 2m පළල 1.5m හා උස 80 cm වන ටැංකියක ධාරිතාවය සොයන්න.

(5) ජල ටැංකියක අභ්‍යන්තර මිනුම් 2.5 m,1.5 m හා 90 cm බැගින් නම්,

1) ටැංකියේ පරිමාව cm^3 වලින් සොයන්න.

2) ටැංකියේ පරිමාව mlවලින් සොයන්න.

3) ටැංකියේ පරිමාව l වලින් සොයන්න.

උදා-: පැත්තක දිග මීටර් 1ක් වූ ඝනක හැඩැති භාජනයක ධාරිතාව

= 1m×1m×1m =$1m^3$

1m = 100 cm නිසා ,

= $100 \times 100 \times 100$ ලෙස සැලකූ විට,

= 1000000 cm^3

= 1000000 ml

= 1000 l

එනම් $1m^3 = 1000l$

(6) පතුලේවර්ගඵලය 100 cm^3 වන භාජනයක උස 8 cm නම් එහි ධාරිතාව සොයන්න.

(7)ධාරිතාව 3000 ml වන භාජනයක උස 15cm නම් එහි පතුලේ වර්ගඵලය සොයන්න.

(8)පතුල සමචතුරස්රාකාර භාජනයක උස 11cm වේ. එහි ධාරිතාව 2475 ml නම්

1) ධාරිතාව cm^3 වලින් දෙන්න.

2) පතුලේ වර්ගඵලය සොයන්න.

3)පතුලේ දාරයක දිග සොයන්න.

(9) ඝන මීටර් 2ක ධාරිතාවක් ඇති වතුර ටැංකියක් සෑදීමට අවශ්‍ය මිනුම් ආකාර 03ක් ඉදිරිපත් කරන්න.

(10) පතුලේ දිග මීටර් 2ක් හා පළල මීටර් 1ක් වූ ටැංකියකට ජලය ලීටර් 1400 ක් කොපමණ උසකට ජලය නගීද?

පිළිතුරු



Answer

NALANDA VIDYALAYA නාලන්දා විද්‍යාලය - කොළඹ 10 NALANDA VIDYALAYA

ඒකක පරීක්ෂණය

9 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 9- ද්‍රව මිනුම්

1.
- I. 2500 ml
- II. 570 ml
- III. 12000 ml
- IV. 83 ml

2.
- I. 8 000 l
- II. 13 000 l
- III. 4 200 l
- IV. 1. 852 l
- V. 16 000l

3. 4m x 3m x 2m

$= 24\ m^3$

$= 24\ 000\ l$

$\frac{24\ 000\ l}{300\ l}$

= 80 min

= 1h 20min

4. 40 cm x 2 200 cm x 30 cm

$= 2\ 640\ 000\ cm^3$

= 2 640 000 ml

= 2 640 l

5. 35 cm x 20 cm x h = 21 000 ml

$\frac{700\ cm^2 \times h}{700\ cm^2} = \frac{21\ 000\ cm^3}{700\ cm^2}$

h = 30 cm

පාඩමේ නම - ද්‍රව මිනුම්

සැකසුම - ඩී.එම් .ගුණවර්ධන / පාසල - අම්/ දේවාලහිඳ විද්‍යාලය/ 0713840888

1. කිසියම් භාජනයක ධාරිතාව යනු එම භාජනයට අල්ලන උපරිම පරිමාවයි.
2. යම් ඝන වස්තුවක් හෝ ද්‍රවයක් හෝ අවකාශයේ අත් කර ගන්නා ඉඩ ප්‍රමාණය එම ඝන වස්තුවේ හෝ ද්‍රවයේ පරිමාවයි. කිසියම් භාජනයක අඩංගු පරිමාව යනු එම භාජනයේ එම මොහොතේ අඩංගු ප්‍රමාණයයි. ධාරිතාව යනු එම භාජනයට අල්ලන උපරිම පරිමාවයි.
3. ml, l cm^3, m^3...
4. 2m x 1.5m x 0.8m = 2.4 m^3 = 2400 l
5.
   I. 250cm x 150cm x 90cm = 3 375 000 cm^3
   II. 3 375 000 ml
   III. 3 375 l
6. 100cm^2 x 8cm = 800 cm^3 = 800 ml
7. A x 15 cm = 3000 ml

   $$\frac{A \times 15\ cm}{15\ cm} = \frac{3000\ cm^3}{15\ cm}$$

   A = 200 cm^2

8.
   I. 2475 cm^3
   II. A x 11 cm = 2475 ml

   $$\frac{A \times 11\ cm}{11\ cm} = \frac{2475\ cm^3}{11\ cm}$$

   A = 225 cm^2

   III. $\sqrt{225} = 15$ cm
9. 1m x 1m x 2m, 0.5m x 2m x 2m, 0.5m x 4m x 1m
10. 2m x 1m x h = 1400 l

    $$\frac{2m^2 \times h}{2m^2} = \frac{1.4m^3}{2m^2}$$

    h = 0.7 m

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ